රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 5/97 (III)

මගේ අංකය: එක්ස්ටීයු/21(III)/7
රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1999.07.16

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## රාජ්‍ය නිලධාරීන් සඳහා රක්ෂණ ක්‍රමයක් ඇති කිරීම (අග්‍රහාර)

ඉහත කරුණ ගැන 1997.01.31 දාතම දරණ අංක: 5/97, 1997.09.01 දාතම දරණ අංක: 5/97 (I) සහ 1998.12.30 දාතම දරණ අංක: 5/97 (II) චක්‍රලේඛ වලට අමතර වශයෙනි.

02. අග්‍රහාර රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අදාලව පහත සඳහන් තීරණ ගනු ලැබ ඇත.

(අ). විවාහක රාජ්‍ය නිලධාරීන්ගෙන් යැපෙන අවුරුදු 26 ට අඩු අවිවාහක දරුවන්ද අවිවාහක නිලධාරීන්ගෙන් යැපෙන වයස අවුරුදු 26 ට අඩු අවිවාහක සහෝදර සහෝදරියන්ද රක්ෂණ ක්‍රමයට ඇතුලත් වේ.

(ආ). පෙර වාරික ණය මුදල් නිසියාකාරව ගෙවා ඇත්නම් ණය සුරැකුම් රක්ෂණාවරණය අග්‍රහාර රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක විමට පෙර ණය සම්බන්ධයෙන් වු ඇපකරුවන් නිදහස් කිරීම සඳහා පිළිගනු ලැබේ.

(ඇ). දරු ප්‍රසුතියන් සඳහා ගර්භනී නිලධාරිනියක් ආරෝග්‍ය ශාලාවකට වාහනයකින් ගෙනයාම හා ආපසු ඒම වෙනුවෙන් රු: 500/- ක් ප්‍රවාහන වියදම් වශයෙන් ගෙවනු ලැබේ.

(ඈ). රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙන් පරිබාහිර ආයතනයකට (විදේශ රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු ලබා ගන්නන් හැර) රජයේ වුවමනාව හෝ රාජ්‍ය ප්‍රතිපත්තිමය හේතු හෝ අනුව තාවකාලික පදනමක් මත, විධිමත්ව මුදා හැර තිබීම රක්ෂණ අයිතිවාසිකම් ලබා ගැනීමට බාධාවක් නොවේ.

(ඉ). රක්ෂණ හිමිකම් ඉල්ලා සිටිමේදී සායනයකට ඉදිරිපත් වන නිලධාරියෙතුගේ රෝග විනිශ්චය තුණ්ඩුවේ මුල්පිටපත වෙනුවට තම දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික කරන ලද රෝග විනිශ්චය තුණ්ඩුවේ ජායා පිටපත භාරගනු ලැබේ. මෙම ක්‍රමය 97.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(ඊ). රජයේ රෝහල්වලින් ප්‍රතිකාර ගැනීමේ දී හිමිකම් ඉල්ලුම් පත්‍රය වෛද්‍යවරයා විසින් අනු අත්සන් කිරීම අවශ්‍ය නොවේ. පෞද්ගලික රෝහලකින් ප්‍රතිකාර ගැනීමේදී හිමිකම් ඉල්ලුම් පත්‍රය වෛද්‍යවරයා විසින් අනුඅත්සන් කිරීම අවශ්‍යය.

(උ). රජයේ රෝහලක ෙ වෛද්‍යවරයාගෙන් ලබාගන්නා ලද වෛද්‍ය සහතිකය/බෙහෙත් වට්ටෝරුව ඔහුගේ නිල මුද්‍රාව නොමැති වුව ද නිල ලියවිල්ලකින්/කඩදාසියකින් ඉදිරිපත් වන වට්ටෝරු බෙහෙත් වෙනුවෙන් මුදල් ප්‍රතිපූර්ණය කිරීම සඳහා ප්‍රමාණවත් ලියවිල්ලක් ලෙස පිළිගැනේ.

(ඌ). සාමාන්‍ය අසනීපවලට බාහිර ප්‍රතිකාර සඳහා යන වියදම් පුතිපූර්ණය කිරිමේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ආකෘති පත්‍රය වෛද්‍යවරුන් ලවා සම්පූර්ණ කරවා ගැනීම අවශ්‍ය නොවේ.

(එ). බාහිර ප්‍රතිකාර ලබා ගැනීමෙන් හෝ රෝහල්ගත වීමකින් වීමකින් දින 90 ක් ඇතුලත අදාල හිමිකම් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නියමිත කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය, අග්‍රහාර රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක වූ 1997.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(ඒ). රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකට පත්කරන ලද පරිවාස කාලයකට යටත්ව සිටින නිලධාරියකුට වුවද එම රක්ෂණ ක්‍රමයට බැඳීමට හැකිය.

(ඔ). ණය සුරැකුම් රක්ෂණ ක්‍රමය දේපළ ණයවලට අමතරව ආයතන සංග්‍රහයේ සඳහන් සියළුම ණය වර්ග ආවරණය කිරීම සඳහා පිළිගැනේ. එනම්, දේපල ණය වලට අමතරව මෝටර් රථයක්/ ස්කූටරයක්/පාගන මැෂිමක් මිලදී ගැනීම ආපදා ණය සහ වෙනත් ණය වර්ග ණයයනගැති භාවයෙන් නිදහස් වීමට කරන ගෙවීම් යනාදියයි.

03. අග්‍රහාර රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ප්‍රාදේශීය වශයෙන් සම්බන්ධිකරණ නිලධාරීන් පත්කරනු ලැබ ඇත. රක්ෂණ ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන්ගේ සහාය ලබාගත හැක.

04. අග්‍රහාර රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක වීමේදී සාවද්‍ය බිල්පත් ඉදිරිපත් කිරීම, බිල්පත්වල සඳහන් සංඛ්‍යා වෙනස් කර හිමිකම් ඉදිරිපත් කිරීම යනාදී වංචනික කටයුතු සිදු වන්නේ නම් එවැනි අයථා කටයුතු වලට සම්බන්ධ වන අයට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

05. ඉහත (2) (ඔ) වැනි වගන්තිය අනුව ආයතන සංග්‍රහයේ අදාල වෙනස් කිරීම් යථා කාලයේ සිදුකරනු ලැබේ.

06. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ එකඟත්වය ඇතිවය.

**පී.ඒ. සේනාරත්න,**
ලේකම්,
රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු හා වැවිලි
කර්මාන්ත අමාත්‍යාංශය.

**සැ.යු.** ඉහත 02 (ඔ) ජේදයේ තුන්වන පේලියේ *පාගන මැෂිමක් * යන්න වෙනුවට පාපාදියක්/මෝටර් සයිකලයක් යන වචන ආදේශ විය යුතුය.